// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2279/08 - 2022 මැයි මස 09 වැනි සඳුදා - 2022.05.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: 3/2/1/142.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය*: 4-3/18/2019/WS/508.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තරය* :-

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 125/2 මිනුවන්ගොඩ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මැඩමුල්ල ගමේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවට ගම්පහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සකස් කරන ලද 2022.02.28 දිනැති මූලික පිඹුරු අංක ගම් 4289හි කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1012 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස :

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: කෝන්ගහවත්ත නොහොත් කෝන්ගහවත්තේ කැබැල්ල; විස්තරය: ගෙවත්ත, අවුරුදු 40-50 පමණ වයසැති පොල් වගාවක් ඇත; හිමිකම් පාන්නා: අංක 11, පොලීසිය පාර, මිනුවන්ගොඩ පදිංචි කේ. ඒ. මාලා මංගලිකා රාජසූරිය කළුආරච්චි; ප්‍රමාණය: හෙක්. 0.1012.

ඉහත සඳහන් ඉඩම/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.07.27 වැනි දින පූ. භා. 10.00ට මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2022.07.20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

,

යූ. ඩබ්ලිව්.ටී. යූ. රාජකරුණා,
ප්‍රාදේශීය ලේකම්,
මිනුවන්ගොඩ.

2022 මැයි මස 04 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05- 0033



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*